පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE


# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 7

## කතෝලික ධර්මය - I පත්‍රය

පාසලේ නම : ……………………………………………………………….

ඇතුළත් වීමේ අංකය :………………………………

කාලය : පැය 02 යි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) දිවසිවරයා යන්නට වඩාත් නිවැරදි වරණය වන්නේ,
   (i) ආලේප කළ තැනැත්තා
   (ii) දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන තැනැත්තා
   (iii) දෙවියන් වහන්සේ උසස් කළ තැනැත්තා
   (iv) දෙවියන් වහන්සේ ශක්තිමත් කළ තැනැත්තා

2) එළියා දිවැසිවරයාට නියං කාලයේ දී කපුටන් විසින් මස් හා රොටී ගෙනවිත් දුන්නේ මෙහි සිටිය දී ය.
   (i) ශාරපෙත් නගරයේ දී   (ii) කාර්මෙල් කන්ද මතදී
   (iii) කෙරිත් ඔය අසලදී   (iv) මිදියන් හිදී

3) ජෝනා දිවසිවරයාගේ මග පෙන්වීම මත දේව කරුණාව ලැබුවේ,
   (i) නිනීවේ වැසියන්   (ii) ජෙරුසෙලමේ වැසියන්
   (iii) තාර්ෂිස්හි වැසියන්   (iv) ජුදයාවේ වැසියන්

4) ප්‍රධාන දිවසිවරයෙක් වන්නේ,
   (i) හොසියා   (ii) ආමොස්   (iii) යෙසායා   (iv) නාතාන්

5) පොරොන්දු දේශය හඳුන්වන තවත් නමකි,
   (i) හාරාන්   (ii) කානාන්   (iii) පාරාන්   (iv) මිදියන්

6) මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ තෝරාගත් පළමු තැනැත්තා,
   (i) ආබ්‍රහම් තුමා   (ii) ජාකොබ් තුමා
   (iii) ඊසාක් තුමා   (iv) මෝසෙස් තුමා

7) ''ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග පොර බදා ජය ගත් බැවින් ඔබේ නම ඊශ්‍රායෙල් වන්නේ ය'' යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,
   (i) ආබ්‍රහම් තුමාට   (ii) මෝසෙස් තුමාට
   (iii) ඊසාක් තුමාට   (iv) ජාකොබ් තුමාට

8) ක්‍රිස්තුන් වහන්සේ පළමු ශ්‍රාවකයන් කැඳවන ලද්දේ ……………………………… අසල දී ය. හිස්තැනට සුදුසු වරණය වන්නේ,
   (i) ගලීල මුහුද   (ii) රතු මුහුද
   (iii) ජෝර්දාන් නදිය   (iv) නයිල් ගඟ

9) ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන ද්‍රව්‍යක් නොවන්නේ,

(i) පාස්කු ඉටිපහන (ii) ජලය

(iii) සුදු වස්ත්‍ර (iv) පූප

10) වතු කම්කරුවන් වෙනුවෙන් තම දූත සේවය සපයන පැවිදි නිකායකි,

(i) නිර්මල මරිය නිකාය (ii) මාරිස්ට් පැවිදි නිකාය

(iii) සිරි කුරුස පැවිදි සොයුරියන් (iv) දොමිනිකාන පැවිදි සොයුරියෝ

**හිස්තැන් පුරවන්න,**

11) …………………………………………… සියලු වස්තුවල හිමිකරුවාණන් ය.

12) …………………………………………… පූජක වේදභාර තුනකි.

13) …………………………………………… කිතුණු විවාහයේ ලක්ෂණයකි.

14) ජපමාල බැතිය හඳුන්වා දුන්නේ ……………………………………………………………….. ය.

15) බොරු කීම නිසා හදිසි මරණයට ගොදුරු වීමට ……………………………………...……………….. ට සිදු විය.

(පැවිදි/ සාන්ත දොමිනික් ගුස්මාන් මුනිතුමන්/ අනනියස්/ දෙවියන් වහන්සේ/ ඒකත්වය/ ශුද්ධ වූ පාවුලු තුමා)

**ගැලපෙන පරිදි යා කරන්න.**

| | |
|---|---|
| 16) බොරු සාක්ෂි නොකියව | මග්නිෆිකාත් |
| 17) ශුද්ධ වූ සභාවේ පණතකි | ශුද්ධ වූ පැය |
| 18) පෙන්තකොස්ත මංගල්‍යයේ කාල වකවානුව හා බැඳේ | අටවන පනත |
| 19) මරියතුමියගේ උදාන ගීයයි | ඥාන ගෝපාලයන් නඩත්තුව |
| 20) ජේසුස් වහන්සේ මල් උයනේ විඳි වේදනා සිහිපත් කරයි | දේවස්ථාන මංගල්‍ය |

## II පත්‍රය

**ප්‍රශ්න 5 ක් තෝරා ගෙන පිළිතුරු ලියන්න.**

1) (i) ඊසාක් උපත ලබන විට ආබ්‍රහම් තුමාගේ වයස කීය ද? **(ලකුණු 2 යි)**
   (ii) ඊසාක් තුමාගේ පුතුන් දෙදෙනා නම් කරන්න. **(ලකුණු 4 යි)**
   (iii) ඊසාක් තුමාගේ ජීවිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ 3 ක් ලියන්න. **(ලකුණු 6 යි)**

2) (i) පූජකවරය ස්ථාපිත කළේ කවදා ද? **(ලකුණු 2 යි)**
   (ii) පදවි පූජක පොරොන්දු දෙක නම් කරන්න. **(ලකුණු 4 යි)**
   (iii) පූජා ප්‍රසාදි තුමන්ලා වෙනුවෙන් අප විසින් ඉටු කළ යුතු යුතුකම් 3 ක් ලියන්න. **(ලකුණු 6 යි)**

3) (i) ශ්‍රාවකයන් හඳුන්වන තවත් නමක් ලියන්න. **(ලකුණු 2 යි)**
   (ii) ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් හතර දෙනෙක් නම් කරන්න. **(ලකුණු 4 යි)**
   (iii) ක්‍රිස්තුන් වහන්සේ ලොවට හඳුන්වා දීමට ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. **(ලකුණු 6 යි)**

4) (i) හත්වන පනත නම් කරන්න. **(ලකුණු 2 යි)**
   (ii) වස්තුව හා දේපල අප ලබාගත යුතු ආකාර දෙකක් ලියන්න. **(ලකුණු 4 යි)**
   (iii) හත්වන දේව පනතින් තහනම් වන දෑ තුනක් ලියන්න. **(ලකුණු 6 යි)**

5) (i) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම වරම් ලැබූ පිරිස කොපමණ ද? **(ලකුණු 2 යි)**
   (ii) දේවස්ථාන මංගල්‍ය පැවැත්වීමේ හේතු 2 ලියන්න. **(ලකුණු 4 යි)**
   (iii) දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය අර්ථවත්ව සැමරීමට ඔබ කරන යෝජනා තුනක් ලියන්න. **(ලකුණු 6 යි)**

6) (i) පාද නමස්කාර ස්ථාන කීය ද? **(ලකුණු 2 යි)**
   (ii) පාද නමස්කාර ස්ථාන දෙකක් ලියන්න. **(ලකුණු 4 යි)**
   (iii) අප අතින් සිදු වූ වැරදිවලට සමාව යදිමින් පාද නමස්කාර අවස්ථාවක දී කිව හැකි යාච්ඤාවක් ලියන්න. (වචන 50 ට වැඩි විය යුතුයි.) **(ලකුණු 6 යි)**

7) පහත මාතෘකා අතරින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(එක් මාතෘකාවකට වාක්‍ය 6 ක් වත් ඇතුළත් විය යුතුයි.)

   (i) ඊශ්‍රායෙල් දිවසිවරු
   (ii) හතරවන පනත
   (iii) ගිහි ධර්ම දූත සේවා
   (iv) වන්දනා ගමන්

**(2 x 6 = 12)**